**GMOA**
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

03/12/2012

## මාධ්‍ය නිවේදනයයි

**වෛද්‍යවරුන්ගේ දරුවන්ට ජාතික පාසල් අධ්‍යාපනය අහිමිවීමේ ගැටළුව.**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ස්ථාන මාරු ලැබූ වෛද්‍යවරුන්ගේ දරුවන් සහ විදේශ වෛද්‍ය පුහුණුව අවසන් කර විශේෂඥ වෛද්‍ය වරුන් වශයෙන් සේවය ඇරඹීම සඳහා පැමිණෙන වෛද්‍යවරුන්ගේ දරුවන්ට පාසල් ලබා දීමේදී මෙතෙක් නොවිසදී ඇති කරුණු ගණනාවක් නිසා වෛද්‍යවරු දැඩි අපහසුතාවයකට පත්ව සිටිති. වසරින් වසර තාවකාලික පිළියම් යෙදුවද පූර්ණ විසදුමක් නොමැති වීමෙන් මෙම ප්‍රශ්ණය නැවත නැවතත් සාකච්ජා කිරීමට සිදුව ඇත. සෞඛ්‍ය ඇමතිතුමා ප්‍රමුඛ සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම ගැටළුවේදී ප්‍රශංසනීය මැදිහත්මක් කලද, සාර්ථක දීර්ඝකාලීන විසදුමක් ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය පියවර ගෙන නැත.

පසුගිය වසරේදී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට මෙම ගැටළුව විසදීමට පෞද්ගලිකව මැදිහත් වීමට සිදුවිය. එසේ වුවත් අද වන විට සෞඛ්‍ය අමතයාංශයේ ස්ථාන මාරු ලැබූ වෛද්‍යවරු තම දරුවන්ට ජාතික පාසල් ලබා ගැනීමේදී පහත අයුරින් දැඩි දුෂ්කරතාවයන්ට ලක්වීම සෞඛ්‍ය සේවා කටයුතු වලටද බාධා ගෙන දී ඇත.

1. 2012/19 චක්‍රලේඛය සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවයේ නියුතු වෛද්‍යවරුන්ගේ සේවා ස්වාභාවය නියෝජනය නොකරන බැවින් 2013 වසරේදී 1 ශ්‍රේණියට ඇතුලත්වීමට සුදුසුකම් නොමැතිව පාසල් අහිමිවූ දරුවන්

2. 2012 වාර්ෂික ස්ථාන මාරු ලැබූ වෛද්‍යවරුන්ගේ පාසල් නොලැබූ දරුවන්

3. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් තුමා විසින් ජාතික පාසල් වලට ඇතුලත් කිරීමට නිර්දේශ කලත් පාසල් වලට ඇතුලත් කර නොගත් දරුවන්

4. වසර තුල වරින්වර ස්ථාන මාරු ක්‍රියාත්මකවීම හා විදේශ පුහුණුව අවසන් කර නැවත සෞඛ්‍ය අමාත්‍යාංශයට වාර්තා කළ විශේෂඥ වෛද්‍යවරුන්ගේ දරුවන්

ඉහත කාණ්ඩ 04ට අයත් දරුවන්ට පාසල් ලබා දීමට සෞඛ්‍ය අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශය සාර්ථක මැදිහත් වීමක් පහත අයුරින් කරනු ඇතැයි රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය බලාපොරොත්තු වේ.

1. 2012/19 චක්‍රලේඛයේ අදාල සංශෝධන සිදුකර ඉදිරි චක්‍රලේඛ හරහා 1 ශ්‍රේණියට ඇතුලත් කිරීම විධිමත් කිරීම.

2. 1 ශ්‍රේණියට වඩා ඉහල ශ්‍රේණි සඳහා බඳවා ගැනීමේ ක්‍රම වේදයක් සකස් කිරීම

3. 2013 වසරේ පළමු පාසල් වාරයේ පළමු දින සිටම දරුවන්ට පාසල් වල ඉගෙනීමට අවස්ථාව ලබාදීම.

දෙසැම්බර් මස පළමු සතිය අවසානයේ ඉහත ඉල්ලීම් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. මෙහි ප්‍රගතිය දෙසැම්බර් මස අවසන් වන විට නැවත විමර්ශණය කිරීමෙන් අනතුරුව අවශ්‍ය වුවහොත් දැඩි වෘත්තිය ක්‍රියා මාර්ගයක් ගැනීමට රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයෙහි විධායක සභාව තිරණය කර ඇත

ස්තුතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්

වැඩිදුර විස්තර :

| | |
|---|---|
| වෛද්‍ය නවීන් ද සොයිසා | 0718582444 |
| වෛද්‍ය චාමින්ද ගුණතිලක | 0717507166 |
| වෛද්‍ය සමන් අබේවර්ධන | 0717356141 |
| වෛද්‍ය ලසන්ත පිනදාස | 0773625788 |